# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල


තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 1514 /2023

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2023

දිනය / திகதி / Date — 04/12/2023 පැය 0825

## මාධ්‍ය නිවේදනය

**01. 2023.12.03 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරින් විසින් සිදු කරන ලද නීති විරෝධී මත්පැන් වැටලීම් සම්බන්ධ වාර්තාව පහත පරිදි වේ.**

| වැටලීම් ගණන | අත්අඩංගුවට ගත් සැකකරුවන් ගණන | නීති විරෝධී මත්පැන් ප්‍රමාණය (ලීටර්) | ගෝඩා ප්‍රමාණය (ලීටර්) | වෙනත් දේපල |
|---|---|---|---|---|
| 04 | 06 | 125 | 1108 | තඹ දඟර 03<br>බැරල් 05<br>ගෑස් සිලින්ඩර් 03<br>ගෑස් ලිප් 02<br>ත්‍රීරෝද රථ 01 |

වැටලීම් සිදු කර අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් සහ දේපල අදාළ පොලිස් ස්ථානයන් වෙත ඉදිරිපත් කර ඇත.

**02. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා මහනුවර කඳවුර.**

2023.12.03 වන දින රාත්‍රී කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා මහනුවර කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත මහනුවර පොලිස් වසමේ බූවැලිකඩ ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 200 ක් හා මත් ද්‍රව්‍ය ජාවාරමෙන් උපයාගන්නා බවට සැකකරන මුදල් රුපියල් 2200/= ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට** ගෙන මහනුවර පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 26 ක් වන තැන්නකුඹුර ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** මහනුවර පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**03. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා කුරුණෑගල කඳවුර.**

2023.12.03 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා කුරුණෑගල කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත ගොකරැල්ල පොලිස් වසමේ පාන්ගොල්ල ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 04 මිලිග්‍රෑම් 860 ක් හා මත් ද්‍රව්‍ය ජාවාරමෙන් උපයාගන්නා බවට සැකකරන මුදල් රුපියල්**

**10,000/= ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට** ගෙන ගොකරැල්ල පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 39 ක් වන ඉබ්බාගමුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** ගොකරැල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**04. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා හම්බන්තොට කඳවුර.**

2023.12.03 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා හම්බන්තොට කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වීරවිල පොලිස් වසමේ ගෝනගමුව ප්‍රදේශයේ දී වැටලීමක් සිදු කර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට** ගෙන වීරවිල පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 60 ක් වන තිස්සමහාරාමය ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** වීරවිල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**05. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා කහවත්ත කඳවුර.**

2023.12.03 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා කහවත්ත කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත සිරිපාගම පොලිස් වසමේ උඩවත්ත ප්‍රදේශයේ දී වැටලීමක් සිදු කර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සහ එම පතරොම් 05 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට** ගෙන සිරිපාගම පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 41 ක් වන රත්නපුර ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** සිරිපාගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**06. බලපත්‍ර නොමැතිව මැණික් ගරමින් සිටි සැකකරුවන් තිදෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා කහවත්ත කඳවුර.**

2023.12.03 වන දින දහවල් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා කහවත්ත කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත කහවත්ත පොලිස් වසමේ පනාවැන්න ඇල අසලදී වැටලීමක් සිදු කර **බලපත්‍ර නොමැතිව මැණික් ගරමින් සිටි සැකකරුවන් තිදෙනෙකු කැණීම් උපකරණ සමඟ** අත්අඩංගුවට ගෙන ඇහැලියගොඩ මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය වෙත භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 32, 46 හා 57 වයස්වල පසුවන කහවත්ත සහ පැල්මඩුල්ල ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

**07. මත්කරල් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා සෙට්ටිකුලම කඳවුර.**

2023.12.03 වන දින සවස් කාලයේදී පොලිස් විශේෂ කාර්ය බලකා සෙට්ටිකුලම කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත පරසන්ගස්වැව පොලිස් වසමේදී වැටලීමක් සිදු කර **මත්කරල් 40 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන වැඩිදුර විමර්ශන සඳහා පරසන්ගස්වැව පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 22 ක් වන රඹෑව ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වන අතර** පරසන්ගස්වැව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරගෙන යනු ලබයි.

**08. මත්කරල් සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා අනුරාධපුර කඳවුර.**

2023.12.03 වන දින දහවල් කාලයේදී පොලිස් විශේෂ කාර්ය බලකා අනුරාධපුර කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත අනුරාධපුර පොලිස් වසමේදී වැටලීම් දෙකක් සිදු කර **මත්කරල් 250 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු හා මත්කරල් 150 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන වැඩිදුර විමර්ශන සඳහා අනුරාධපුර පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් වයස අවුරුදු 23 ක් හා 38 ක් වන වන අනුරාධපුර හා සාලියපුර ප්‍රදේශවල පදිංචිකරුවන්වේ** . අනුරාධපුර පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරගෙන යනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**